ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2017/2018

LLU5712/LWU3315- පොදු අන්තර්ජාතික නීතිය

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2020.03.03 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30

---

සම්පූර්ණ ප්‍රශ්න ගණන 08 යි.
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. රොබෝ සහ කොකෝ පිළිවෙලින් රොමේකා සහ කැලෝකා රාජ්‍යයන්හි පුරවැසියෝ වෙති. ඔවුන් කැලෝකා සිට ගවුලියාවට නීති විරෝධී මත් ද්‍රව්‍ය ගෙන ඒමේ සහ මුහුදු කොල්ලකෑමේ ජාවාරමක නිරතව සිටිති. ගවුලියානු රහස්‍ය සේවක නියෝජිතයකු විසින් රොබෝ සහ කොකෝ අමතා නව වෙළඳ ව්‍යාපාරයක් සංවිධානය කර දෙන බවට දන්වමින් කැලෝකාවේ සිට කොන්ග් පින්ග් රාජ්‍යය වෙත ඔවුන්ව ගෙන්වා ගැනීමට පොළඹවා ගනිති. කොන්ග් පින්ග් හි ජනප්‍රිය වෙළඳ ව්‍යාපාරිකයකුගේ උපන් දින සාදයක් සඳහා ඔවුනට ආරාධනා කරන ලදී. සාදය අතරතුර දී කොන්ග් පින්ග් පොලිසිය විසින් ඔවුන් අත්අඩංගුවට ගන්නා ලදී. ගවුලියානු රජය විසින් ඔවුන්ව ගවුලියාවට උදර්පනය කරන ලෙස ඉල්ලා සිටියේ ය.

රොබෝ සහ කොකෝ වෙනත් කරුණු අතර, තර්ක කරමින් කියා සිටින්නේ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කුමන්ත්‍රණයට කොන්ග් පින්ග් දේශභූමියෙන් පිටත දී ඇතුළු වූ බවත්,ඔවුන්ව රඳවා තබාගෙන ගවුලියාවට උදර්පනය කිරීමට බලධාරීන්ට බලය ලබා දෙන කිසිම වරදක් කොන්ග් පින්ග් හි දී සිදුකර නැති බවත් ය. ඒ නිසා කොන්ග් පින්ග්හි රඳවා තබා ගැනීම නීති විරෝධී බවත් ය.

ඉහත සිද්ධියෙන් පැන නගින අදාල නීතිමය ගැටලු සාකච්ඡා කරන්න.
අදාල උදාහරණ සහ නඩු තීන්දු ඇසුරින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02. “එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 2(4) වන ව්‍යවස්ථාව යටතේ බලය යෙදීමේ තහනමට ඇති එකම ව්‍යතිරේඛය වන්නේ, රාජ්‍යයක දේශභූමිය ආක්‍රමණය කරන අවස්ථාවක දී බලය යෙදීමට අවසර ලබා දෙන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 51 වන ව්‍යවස්ථාවයි.”

මෙය තත්කාලීන අන්තර්ජාතික නීතිය පිළිබඳ නිවැරදි ඇගයීමක් වන්නේ ද?
අදාල සන්ධාන නීතිය සහ නඩු තීරණ ඇසුරෙන් ඔබේ පිළිතුර සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

03. “නව රාජ්‍යයක් හෝ ආණ්ඩුවක හෝ භෞමික වෙනසක් අනුමත කිරීම හෝ අනුමත නොකිරීම, ප්‍රකාශ කිරීම සඳහා දේශපාලනමය මෙවලමක් ලෙස පිළිගැනීම හෝ පිළිගැනීම අත්හිටුවීම බොහෝ විට භාවිතා වේ. නව රාජ්‍යයක් හෝ ආණ්ඩුවක් වෙනුවෙන් ප්‍රකාශිත අදහස එහි නෛතික ස්වභාවය සහ පිළිගැනීමේ ප්‍රතිඵල සම්බන්ධයෙන් අපැහැදිලි බවකින් තොර නොවන අතර ජාත්‍යන්තර නීති සිද්ධාන්ත ඇතැම් කේන්ද්‍රීය ප්‍රශ්න සම්බන්ධයෙන් වෙන්ව පවතී.”

M.Sorensen *Manual of Public International Law* (ed.), (London; Macmillan,1998), at p. 27

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. ඔබ මෑත කාලීන උදාහරණ සහ නඩු තීන්දු නීතිය මඟින් පිළිතුර තහවුරු කළ යුතුය.

(ලකුණු 20)

04. “අන්තර්ජාතික නීතිය දේශීය අධිකරණ ඉදිරියේ යම් තත්ත්වයක් භුක්ති විඳිනු ලැබුවද, සියලු අන්තර්ජාතික නීති රීති ස්වයංක්‍රීයව ඕනෑම රටක දේශීය නීතියේ කොටසක් බවට පත්වන බව එයින් අදහස් නොකෙරේ. මෙයට එක් හේතුවක් වන්නේ අන්තර්ජාතික නීතිය යනු තනි නීති පද්ධතියක් නොවන නමුත් සාම්ප්‍රදායික වර්ගීකරණය යටතේ එයට ප්‍රධාන වශයෙන් සංධාන රීති සහ චාරිත්‍රානුකූල රීති මෙන්ම නීතියේ පොදු මූලධර්ම ඇතුලත් වීමයි.”

A.Abass, *International Law Text, Cases, and Materials*, (2ed) Oxford University Press 2014, at p.315

අන්තර්ජාතික නීතිය සහ දේශීය නීතිය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ අදාළ න්‍යායයන් සහ රාජ්‍ය භාවිතයන් සැලකිල්ලට ගනිමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

05. "රාජ්‍ය විනිර්මුක්තිය යනු වාණිජ සබඳතාවන්හි වර්ධනය හේතුවෙන් බොහෝ දුරට සීමා වී ඇති සංකල්පයකි. කෙසේ වුවද, සංවේදී කරුණු (උදා: මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ) සම්බන්ධයෙන් රාජ්‍යයන්ගේ නූතන හැසිරීම් සැලකිල්ලට ගැනීමේ දී මෙම සංකල්පය තවදුරටත් සීමා කළ යුතු බවට යෝජනා වී ඇත."

රාජ්‍යයන් තුළ සිටින ජනතාවගේ අයිතිවාසිකම් කෙරෙහි රාජ්‍ය විනිර්මුක්තිය පිළිබඳ සංකල්පය බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

06. 'ලෝක ගුරු සම්මේලනයේ' අන්තර් ජාතික සංගමය විසින් 'ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධ සුදුසුකම් හඳුනා ගැනීම' පිළිබඳ යම් යම් මූලධර්ම සංග්‍රහගත කිරීම සඳහා සම්මුතියක් කෙටුම්පත් කර ඇත. මෙම සම්මුතිය අපරානුමතිය සඳහා දැන් විවෘතව පවතින අතර සම්මුතිය පිළිගැනීම සඳහා සහභාගී වූ රාජ්‍ය 51 ක් සම්මුතිය අපරානුමත කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටිති. සම්මුතිය පිළිගැනීමේ රාජ්‍ය දූත සමුළුවට සහභාගී නොවූ මයිසූර් රාජ්‍යය ද මෙම සම්මුතියට අත්සන් තැබීම පිළිබඳව සලකා බලමින් සිටින මුත් එහි 'අධ්‍යයන ගුණාත්මකභාවය' සහ 'රාජ්‍යයන්ගේ වාර්ෂික ශ්‍රේණිගත කිරීම' (සම්මුතියේ 8 (අ) වගන්තිය) යන ප්‍රතිපාදනය සම්බන්ධව එතරම් පැහැදීමකින් නොසිටින අතර මයිසූර් රාජ්‍යය කෙරෙහි 8 (ආ) වගන්තියෙන් කිසිදු නෛතික බැඳීමක් ඇති නොකෙරෙනු ඇතැයි යන කොන්දේසියට යටත් ව සම්මුතියට අත්සන් තැබීමට තීරණය කරයි. බසියානා රාජ්‍යය මයිසූර් රාජ්‍යයේ ස්ථාවරය සම්බන්ධයෙන් විරෝධය පළ කරයි. මයිසූර් රාජ්‍යයෙන් විශාල වශයෙන් විදෙස් ආධාර ලබා ගන්නා සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයක් වන සෙලින් රාජ්‍යය මයිසූර් රාජ්‍යයේ තීරණය පිළිගනී. සංවර්ධනය වෙමින් පවතින තවත් රාජ්‍යයක් වන පෝලර් රාජ්‍යය, 8 (අ) වගන්තිය, පෝලර් හා මයිසූර් රාජ්‍යයන් අතර අදාළ නොවනු ඇතැයි යන කොන්දේසියට යටත්ව මයිසූර් රාජ්‍යයේ තීරණයට සහය පළ කරයි. සම්මුතියේ 19 වන වගන්තිය මඟින් අපරානුමත කරනු ලබන අවස්ථාවේ දී හෝ එයට පසු දිනයක දී සම්මුතියේ ඕනෑම වගන්තියක අදාළභාවය පිළිබඳ ව කරුණු පැහැදිලි කිරීමක් හෝ වෙනස් කිරීමක් ගොනු කිරීමට ඕනෑම රාජ්‍යයකට ඉඩ ලබා දී ඇත.

ඉහත සම්මුතිය අදාල රාජ්‍යයන්ට බලපාන ආකාරය සම්බන්ධව සාකච්ඡා කරමින් රචනාවක් ලියන්න.

ඔබේ පිළිතුරේ දී 1969 සම්මුති සම්බන්ධ වියානා සම්මුතියේ දක්වා ඇති රාජ්‍යයන්ගේ බැඳීම් කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. (ලකුණු 20)

07. පහත ඒවායින් දෙකක් (02) පිළිබඳ සටහන් ලියන්න.

(අ) ජාත්‍යන්තර නීතියේ ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස ශිෂ්ඨ සම්පන්න ජාතීන් විසින් පිළිගත් නීතියේ පොදු මූලධර්ම අදාළ කර ගැනීම.

(ආ) දේශභූමියක් අත්කර ගැනීමේ සාමාන්‍ය ක්‍රමවේදයන් සහ තත්කාලීන අන්තර් ජාතික නීතිය තුළ ඒවායේ වැදගත්කම.

(ඇ) 1961 තානාපති සබඳතා පිළිබඳ වියානා සම්මුතියේ 27 වගන්තියට අනුව තානාපති සන්නිවේදනයට අදාළ නීතිය.

(ලකුණු 10 x 2 = 20)

08. 2019 වසරේ දී අන්තර්ජාතික යුක්ති අධිකරණය සිය 73 වන සංවත්සරය සමරනු ලැබීය. අන්තර්ජාතික යුක්ති අධිකරණය විසින් අන්තර්ජාතික නීතියට කරන ලද දායකත්වය සනිටුහන් කරනු පිණිස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සංවිධානය කරන ලද 'අන්තර්ජාතික නීතිය හා යුක්තිය වෙත පවතින වත්මන් අභියෝග' යන මැයෙන් විශ්ව සමුළුවේ දී දේශනයක් පැවැත්වීම සඳහා සහබාද් හි විදේශ ඇමතිවරයා වන අභිෂේක් ශර්මා මහතාට ආරාධනා ලැබී ඇත. සංඛ්‍යාලේඛන දෙස බැලීමේදී අන්තර්ජාතික යුක්ති අධිකරණයෙන් අන්තර්ජාතික නීතියට සිදු වී ඇති සැබෑ දායකත්වය පිළිබඳව අභිෂේක් මහතා තුළ සැකයක් හටගෙන ඇත.

ඔහුට ඔබගේ සහය අවශ්‍ය වේ. පර්යේෂණ සහායක වශයෙන්, අන්තර්ජාතික නීතියට අන්තර්ජාතික යුක්ති අධිකරණයේ දායකත්වය, එහි වාසි දුර්වලතාවයන් සහ අනාගතයේ දී අධිකරණය වඩාත් ඵලදායී කළ හැකි ආකාරය පිළිබඳ යෝජනා සම්බන්ධයෙන් රචනාවක් ලියන්න.

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.